# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 26 දරන ගමගේ ආතර් පෙරේරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2009 අංක 26 දරන ගමගේ ආතර් පෙරේරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 21 වන දින]

එල්.ඩී.—ඕ. අයි.එන්.සී. (38/2005).

**ගමගේ ආතර් පෙරේරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ගමගේ ආතර් පෙරේරා" පදනම යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එකී පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එය පොදුජන යහපත සඳහා වන බැවින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 26 දරන ගමගේ ආතර් පෙරේරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ගමගේ ආතර් පෙරේරා" පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන්ගේ සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "ගමගේ ආතර් පෙරේරා පදනම" යන නමින් සහ යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රා තබා ගැනීමේ දී ද එය පාවිච්චි කිරීමේ දී ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ගමගේ ආතර් පෙරේරා පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ගමගේ ආතර් පෙරේරාගේ නාමයෙන් වැඩිහිටි නිවාස, අනාථ නිවාස සහ සමාජ සුබසාධන මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යාම ;

(ආ) දුප්පත් අසරණ ජනතාවට මෙන් ම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම්, ආහාර ද්‍රව්‍ය සහ නිවාස පහසුකම් සපයා දීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ දරන වෙනත් සමාගම්, සංවිධාන හෝ සමිති සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ සපුරා ගැනීමේ ලා සම්මන්ත්‍රණ, සාකච්ඡා, රැස්වීම්, කණ්ඩායම් පාඨමාලා, දේශන ආදිය පැවැත්වීම සහ එවැනි රැස්වීම් පැවැත්වීමට මූල්‍යාධාර සැපයීම ; සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ව්‍යාප්ත කිරීමට සහ ප්‍රචලිත කිරීමට ප්‍රයෝජනවත් වන පොත්, සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර ආදිය මුද්‍රණය කොට බෙදා හැරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු සභාපති, උප සභාපතිවරු දෙදෙනෙක්, ලේකම්, භාණ්ඩාගාරික ද ඇතුළුව සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන හත් දෙනකුට නො අඩු පාලන මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් වශයෙන් සිටියා වූ තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය සංයුක්ත විය යුතු අතර, ඒ ප්‍රථම පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන තෙක් ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ යම් පරමාර්ථයක් මුදුන් පමුණුවා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය කුමන හෝ කටයුතු, කාරණා හා දේවල් ඉටු කිරීම, බැංකු ගිණුමක් විවෘත කිරීම, එය පවත්වාගෙන යාම හා වසා දැමීම, ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ලබාගැනීම හෝ අරමුදලක් ගොඩනැගීම, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබාගැනීම හෝ එකතු කිරීම, එහි මුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ කටයුතු කරගෙන යාමට නිලධාරීන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම හෝ සේවයෙන් පහ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සැදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම හෝ නෙරපා හැරීම ;

(ආ) නිලධරයන් තෝරාපත් කර ගැනීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය අත් හැරීම හෝ ඔවුන් ධුරයෙන්, බලතලවලින් හෝ කාර්ය භාරයෙන් ඉවත් කිරීම ;

(ඇ) පාලක මණ්ඩලයේ, සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එහි බලතල, චර්යාව හා කාර්යභාරය සහ පාලක මණ්ඩල සාමාජිකත්වයේ කාලවකවානුව ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධාරීන්, ඒජන්තවරු සහ සේවකයන්ගේ බලතල, චර්යාව හා කාර්යභාරය ;

(ඉ) පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය, එබඳු රැස්වීම් පැවැත්වෙන වේලාවල්, පැවැත්වෙන ස්ථානය, දැන්වීම් හා න්‍යාය පත්‍රය, ගණපූරණය සහ රැස්වීමේ දී සාකච්ඡා කළ යුතු කාරණා ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය එහි අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වා ගැනීම හා ඒවාහි විගණනය ; සහ

(ඌ) පොදු වශයෙන් සංස්ථාවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා එහි කටයුතුවල කළමනාකරණය.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම, එවැනි රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත්වනු ඇත.

පදනම විසින් හෝ පදනමට ගෙවිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් විය යුතු අතර, එදිනට පදනමට ලැබිය යුතු ග්‍රාහක මුදල් හා දායක මුදල් මෙම පනතේ කාර්යයන් උදෙසා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාව එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග හෝ රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව වෙත හෝ සංස්ථාව වෙනුවෙන් ලැබෙන මුදල්, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

ගිණුම් හා විගණනය.

**10.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලුම මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට සංස්ථාව විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත්කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ සාමාජිකත්වය දරන විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට, විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔවුන් විසින් සහතික කළ යුතු ය.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව, යම් දේපළක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** පාලක මණ්ඩලය විසින් දෙනු ලැබූ බලය යටතේ සහ සභාපතිවරයා, ලේකම්වරයා හෝ පාලක මණ්ඩල සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම ලියා අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරන අත්සනකට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.